# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව

## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை

## Media Freedom Rights Monitoring Report

MFRMD

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

2021 - කලාප අංක 02 - පෙබරවාරි

මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්/පසු විපරම් සම්බන්ධ කෙටි වාර්තා කිරීමක් මාධ්‍ය නිදහස සම්බන්ධ නිරීක්ෂණ වාර්තාවට ඇතුළත් වන අතර, ඒවාට අදාළව කෙටි නිරීක්ෂණද සටහන් කරයි. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්ද මෙහිදී අදාළ කර ගෙන ඇත. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂයපථයට/සංරචකයන්ට අදාළ නව සිදුවීම් 4ක් හා පැරණි සිදුවීම්වලට අදාළ වර්ධනයන්/පසු විපරම් 3ක් 2021 පෙබරවාරි මාසය තුළ නිරීක්ෂණය විය.

## පෙබරවාරි මාසය තුළ වාර්තා වූ නව සිදුවීම්

1. කතරගම පොලිසියේ නිලධාරියකුට කොරෝනා ආසාදනය වීම පිළිබඳව පුවතක් වාර්තා කිරීම හේතුවෙන් එම නිලධාරියා විසින් ලංකාදීප පුවත්පතේ කතරගම ප්‍රාදේශීය මාධ්‍යවේදී එම්.කේ. නන්දසේනට දුරකථනයෙන් තර්ජනය කිරීම.
2. උතුරේ සිවිල් සංවිධාන සහ දේශපාලන පක්ෂ විසින් සංවිධානය කර තිබූ විරෝධතා ව්‍යාපාරය වැළැක්වීම සඳහා පොලීසිය විසින් අධිකරණයෙන් ලබාගත් තහනම් නියෝග නොතකා රැස්වීමේ හා අදහස් පළ කිරීමේ අයිතිය රැක ගැනීම. (පොලිසිය විසින් මේ නියෝගය මඩකලපුවේ මාධ්‍යවේදීන් තිදෙදෙනකුටද ලබා දී තිබීම)
3. විද්‍යුත් හා නව මාධ්‍ය නියාමනයද ඇතුළත් වන පරිදි ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ජනමාධ්‍යවේදීන්ද ඇතුළුව සිවිල් පුරවැසියන්ගේ අදහස් හා යෝජනා කැඳවීම.
4. ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මකභාවයට පත් වී වසර 4ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් තොරතුරු කොමිෂන් සභාව විසින් නිවේදනයක් නිකුත් කිරීම
5. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඡායාරූප ඇතුළත් වීඩියෝවක් ටික් ටොක් සමාජ ජාලයේ පළ කළේය යන චෝදනාව මත 25 හැවිරිදි තරුණයකු වත්තල ප්‍රදේශයේදී පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම.

## පැරණි සිදුවීම්වල වර්ධනයන්/පසු විපරම්

1. ෆෙස්බුක් සමාජජාලාවේ පළ කළ කෙටිකතාවක් හේතුවෙන් ICCPR පනත යටතේ ලේඛක ශක්තික සත්කුමාරට එරෙහිව පවරා තිබූ නඩුවෙන් ඔහු නිදොස් කොට නිදහස් කිරීමට අධිකරණය තීරණය කිරීම.
2. 2008 වසරේදී ජාතික රූපවාහිනිය මගින් විකාශනය කළ සංවාදමය වැඩසටහනක් වාරණයට ලක් කිරීමට එරෙහිව ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ජයග්‍රහණය කිරීම.

**වගු අංක: 01 වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 පෙබරවාරි**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍යවේදීන් ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 02 |
| 02 | නිතීමය ගැටලු | 05 |
| | **එකතුව** | **07** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම, ජනමාධ්‍ය නිදහස පිළිබඳ අත්‍යවශ්‍ය සාධකයකි. මෙම මූලික නිදහසට අභියෝග එල්ල වූ සිදුවීම් දෙකක් පෙබරවාරි මාසය තුළ නිරීක්ෂණය විය. මින් එකක් අලුතින් හටගත් සිදුවීමක් වන අතර අනෙක, පෙර සිදුවීමකට අදාළ නඩුවක සාධනීය ප්‍රතිඵලයකි. පෙර වූ සිදුවීමට මුහුණ දී තිබුණේ මාධ්‍යවේදියෙකු නොව ලේඛකයෙකි. එය ප්‍රකාශනයේ නිදහසට තර්ජනයක් එල්ල වූ අවස්ථාවකි.**

**2 වගුව: 2021 පෙබරවාරි: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 02**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | තර්ජනය කිරීම | 01 |
| 02 | ප්‍රකාශනයේ නිදහස අහිමි කිරීම | 01 |
| | **එකතුව** | **02** |

## මාසය තුළ නව සිදුවීම්:

01. **කතරගම පොලිසියේ නිලධාරියකුට කොරෝනා ආසාදනය වීම පිළිබඳව පුවතක් වාර්තා කිරීම හේතුවෙන් එම නිලධාරියා විසින් ලංකාදීප පුවත්පතේ කතරගම ප්‍රාදේශීය මාධ්‍යවේදී එම්.කේ. නන්දසේනට දුරකථනයෙන් තර්ජනය කිරීම.**

    කොළඹ පැවති නිදහස් දින උලෙළට කතරගම පොලිසියෙන් සහභාගී වූ උසස් නිලධාරියෙකුට කොරෝනා අසාදනය වී ඇති බවත් ඔහු සමග තවත් නිලධාරීන් දෙදෙනෙකු නිරෝධායනයට යොමු කර ඇති බවත් සඳහන් පුවතක් ලංකාදීප පුවත්පතට වාර්තා කිරීම හේතුවෙන් නන්දසේන මහතා මෙම තර්ජනයට ලක්ව ඇත. එම පුවත පළ වීමෙන් පසු 2021.02.10 දින දහවල් 12.130 එම නිලධාරියා තමන්ට දුරකතනයෙන් කතා කර 'ඇයි මේක පත්තරේ දැම්මේ. මම සනීප වෙලා ආවම බලා ගන්නම්' ආදි වශයෙන් තර්ජනය කළ බවත් ඒ පිළිබඳව කතරගම ස්ථානාධිපතිවරයාට, සහකාර පොලිස් අධිකාරීවරයාට සහ තංගල්ල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවීන්ද්‍ර අඹේපිටිය මහතාට දුරකතනයෙන් මෙන්ම ලිඛිත පැමිණිල්ලක් කළ බවත් මාධ්‍යවේදී නන්දසේන මහතා ප්‍රකාශ කරයි.

    මේ සම්බන්ධයෙන් වාර්තා කරන ලංකාදීප වෙබ් අඩවිය, සිද්ධියට අදාළ පොලිස් නිලධාරියාගෙන් ඒ පිළිබඳව දුරකථනයෙන් කරුණු විමසා ඇති අතර, තමන්ගෙන් නොවිමසා එම පුවත පළ කළේ ඇයිද යන්න ගැන මාධ්‍යවේදියාගෙන් විමසූ නමුත් තර්ජනයක් සිදු නොකළ බව පවසා තිබේ. මාධ්‍යවේදියාගේ පැමිණිල්ල පිළිබඳව තවදුරටත් පරීක්ෂණ පැවැත්වේ.

## පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්:

ෆේස්බුක් සමාජජාලයේ පළ කළ කෙටිකතාවක් හේතුවෙන් ICCPR පනත යටතේ ලේඛක ශක්තික සත්කුමාරට එරෙහිව පවරා තිබූ නඩුවෙන් ඔහු නිදොස් කොට නිදහස් කිරීමට අධිකරණය තීරණය කිරීම.

සිය ෆේස්බුක් ගිණුමේ පළ කළ 'අර්ධ' නම් කෙටි කතාවක් සම්බන්ධයෙන් ICCPR පනත යටතේ අධිකරණය ඉදිරියේ චෝදනා ලැබ සිටි ලේඛකයකු වන ශක්තික සත්කුමාර අදාළ චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට පෙබරවාරි 09 වැනිදා පොල්ගහවෙල මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. අදාළ නඩුව ඉදිරියට ගෙන යෑමට ප්‍රමාණවත් කරුණු නොමැති බවට නීතිපතිවරයා අධිකරණය වෙත කළ දැනුම්දීම මෙම නඩු තීන්දුවට පාදක විය.

ලේඛක ශක්තික සත්කුමාර මෙම සිදුවීම පදනම් කරගෙන වසර දෙකකට අධික කාලයක් තිස්සේ දුෂ්කරතා රැසකට මුහුණ පෑ අතර, මාස 4කට අධික කාලයක් රිමාන්ඩ් භාරයේ සිටීමටත්, මාස 10කට අධික කාලයක් රැකියාවෙන් බැහැරව සිටීමටත් ඔහුට සිදු විය.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මෙම සිදුවීම සම්බන්ධයෙන් මුල සිටම දැරූ ස්ථාවරය වූයේ එය අයුක්තිසහගත අත්අඩංගුවට ගැනීමක් බවයි. ශක්තික අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඒ පිළිබඳව අප්‍රසාදය පළ කරමින් 2019 අප්‍රේල් 02 වැනිදා නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, එම ක්‍රියාව ශ්‍රී ලංකාව අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ප්‍රඥප්තියට අත්සන් තැබීමෙන් ජාත්‍යන්තර ප්‍රජාවට හා මහජනතාවට සහතික වූ අරමුණුවලට පටහැනි බව පෙන්වා දුන්නේය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ශක්තික වෙනුවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් වූ අතර මෙම පැමිණිල්ල විභාග කළ 'අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව' 2019 දෙසැම්බර් මාසයේදී

සිය නිරීක්ෂණ ප්‍රකාශයට පත් කළේය. 'නීත්‍යනුකූල ලෙස පුද්ගල අදහස් ප්‍රකාශනය' වැළැක්වීමට ICCPR පනත අවභාවිත කිරීමේ රටාවේ එක් පියවරක් ලෙස සත්කුමාර අත්අඩංගුවට ගැනීම සැලකිය හැකියැයි එම නිරීක්ෂණවලින් ප්‍රකාශ කර ඇත. (Mr. Sathkumara's arrest is part of a pattern of abusive applications of the ICCPR Act that serve to suppress a large swath of legitimate forms of individual expression.) ශක්තික නිදහස් කිරීමේ තීන්දුවට පසු දින (2021 පෙබරවාරි 10) පොලිස්පතිවරයා අමතමින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, **ලේඛක ශක්තික සත්කුමාර නඩු තීන්දුව පූර්වාදර්ශයක් කොට ගෙන, ICCPR පනත අවභාවිත කරමින් පොලීසිය විසින් කරන අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් වළක්වන්නැයි** පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, ICCPR පනතේ භාවිතය සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට මින් පෙර ලබා දී ඇති උපදෙස්, එමගින් විශේෂයෙන් සිහිපත් කර තිබේ.

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 5ක් පෙබරවාරි මාසය තුළ නිරීක්ෂණය විය. එම සිදුවීම් නීතිමය ක්‍රියාමාර්ග, මාධ්‍ය නිදහසට සීමා පැනවීම, මාධ්‍ය අන්තර්ගතය වාරණය කිරීම සහ තොරතුරු දැනගැනීමේ අයිතිය යන උප ශීර්ෂවලට අයත් වේ. මෙයින් සිදුවීම් 4ක් පෙබරවාරි මාසය ඇතුළත සිදු වූ නව සිදුවීම් වන අතර එකක් පැරණි සිදුවීමක වර්ධනීය අවස්ථාවකි.**

**3 වගුව**

**2021 පෙබරවාරි: නීතිමය කොන්දේසි - සිදුවීම් 05**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 02 |
| 02 | අදහස් ප්‍රකාශනයට නීතිමය සීමා පැනවීම | 01 |
| 03 | මාධ්‍ය අන්තර්ගතය වාරණය කිරීමට එරෙහි නීතිමය ජයග්‍රහණයක් | 01 |
| 04 | තොරතුරු දැනගැනීමේ අයිතිය | 01 |
| | එකතුව | 05 |

## මාසය තුළ නව සිදුවීම්:

1. **උතුරේ හා නැගෙනහිර සිවිල් සංවිධාන සහ දේශපාලන පක්ෂ විසින් සංවිධානය කළ විරෝධතා ව්‍යාපාරයට එරෙහිව අධිකරණයෙන් ලබාගත් තහනම් නියෝග නොතකා තම අයිතිය වෙනුවෙන් ක්‍රියා කිරීම. (මෙම නියෝගය මඩකලපුවේ මාධ්‍යවේදීන් තිදෙනකුට ද ලැබී තිබීම)**

   උතුරු හා නැගෙනහිර පළාත්වල සිවිල් සංවිධාන සහ දේශපාලන පක්ෂ විසින් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් රජයට විරෝධය පළ කිරීම සඳහා පෙබරවාරි 3 වැනිදා සිට 6 වැනිදා දක්වා උද්ඝෝෂණ ව්‍යාපාරයක් සංවිධානය කර තිබිණි. මෙම උද්ඝෝෂණ ව්‍යාපාරය නතර කිරීමේ අරමුණින් විවිධ පුද්ගලයන්ට එරෙහිව අධිකරණයෙන් වාරණ නියෝග ලබාගැනීමට පොලිසිය ක්‍රියා කළේය. දෙමළ සංධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම සිවිල් සංවිධාන නියෝජිතයන්ද ඒ අතර වෙයි.

   කළුවාංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක AR/31/2021 ට අදාළව නිකුත් කර ඇති තහනම් නියෝග යේ දැක්වෙන්නේ, **"පොලිසිය විසින් අදාළ උද්ඝෝෂණය නැවැත්වීම වෙනුවෙන් තහනම් නියෝගයක් පැනවීම සඳහා වූ හේතුකාරණා වශයෙන්, කොරෝනා වසංගතය දැඩි ලෙස පැතිරෙන කාලයක් වීම හා රජයට එරෙහිව ජනතාව උසිගැන්වීම මඟින් ජාතීන් සහ ආගමික කණ්ඩායම් අතර බෙදීම් ඇති විය හැකි බවට මෙම ගරු අධිකරණය සෑහීමට පත්වන බැවින්, 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 106(1) වගන්තිය ප්‍රකාරව, කළුවාංචිකුඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති උ.පො.ප. උපුල් ගුණවර්ධන ඉල්ලා සිටි පරිද්දෙන්"** තහනම් නියෝගයක් පනවන බවයි.

   මෙම වාරණ නියෝගය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස රැස්වීමේ හා විරෝධතා පළ කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීමක් වන අතර මාධ්‍යවේදීන් තිදෙනෙකුටද එම නියෝගය භාර දී ඇත. එයින් වාර්තා කිරීමට එරෙහි නියෝගයක් පනවා නොතිබුණ අතර මාධ්‍යවේදීන් තිදෙනා උද්ඝෝෂණය සංවිධානය කළ සිවිල් හා දේශපාලන කණ්ඩායම්වල ක්‍රියාකාරීන් වීම එම නියෝගය ලබාදීමට හේතුව බව පෙනෙන්නට තිබිණි. මඩකලපුවේ පුණ්‍යමූර්ති ශෂිකරන්,

නිලාන්දන් සහ සයන් යන මාධ්‍යවේදීන් එසේ උද්ඝෝෂණය නොපවත්වන ලෙසට වාරණ නියෝග ලැබූවන් අතර වූහ. ශෂිකරන් ශක්ති ටීවී, සිරස ටීවී, වීරකේසරී යන මාධ්‍යවල මඩකලපුවේ වාර්තාකරු වන අතර නිලාන්දන් 'නීලකන්' වෙබ් අඩවියේ මාධ්‍යවේදියකු ලෙසද සයන් 'බැටි නිවුස්' වෙබ් අඩවියේ මාධ්‍යවේදියකු ලෙසද කටයුතු කරයි. වාරණ නියෝග නොතකා උද්ඝෝෂණ ව්‍යාපාරය පැවැත්වුණ අතර මාධ්‍යවේදීන් එය වාර්තා කිරීමද කර තිබුණි. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය වැළැක්වීමට ගත් නීතිමය ක්‍රියාමාර්ගයක් නොතකා එයට අභියෝග කළ අවස්ථාවක් ලෙස මෙම සිදුවීම කැපී පෙනේ.

මාධ්‍යවේදීන්ට මෙම වාරණ නියෝගය භාර දීමට හේතු පිළිබඳව පිළිබඳව විමසා බැලීමේදී නිරීක්ෂණය වූ කරුණක් නම්, ඉහත මාධ්‍යවේදීන්ගේ සිවිල් සමාජ භූමිකාව හා දේශපාලන පසුබිම ඊට හේතු වී ඇති බවයි. මාධ්‍යවේදියකු ලෙස කටයුතු කිරීමට අතිරේකව ශෂිකරන් රාජ්‍ය නොවන සංවිධානයක සංවිධායකවරයකු ලෙස කටයුතු කරන අතර ඔහු සහ සයන් යන දෙදෙනාම මැතිවරණ සඳහා අපේක්ෂකයින් ලෙස තරඟ කර තිබේ. වාරණ නියෝග ඔවුන්ගේ පෞද්ගලික නම්වලට නිකුත් කර ඇති අතර පොලිසිය පවසන්නේ ඔවුන් උද්ඝෝෂණ ව්‍යාපාරයේ සංවිධායකයින් නිසා එම නියෝග පනවන ලද බවයි.

2. **විද්‍යුත් හා නව මාධ්‍ය නියාමනයද ඇතුළත් වන පරිදි ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ජනමාධ්‍යවේදීන්ද ඇතුළුව සිවිල් පුරවැසියන්ගේ අදහස් හා යෝජනා කැඳවීම.**

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ව්‍යුහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කර විද්‍යුත්, මුද්‍රිත හා නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන පිළිබඳව විනිශ්චය ආයතනයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණින්, දැනට පවතින පනත සංශෝධනය සඳහා මාධ්‍යවේදීන් ඇතුළු සිවිල් පුරවැසියන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිවේදනයක් පළ කෙරිණි.

2020 පෙබරවාරි 07 දාතමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි සහ පුවත්පත්වල පළ කර තිබූ මෙම දැන්වීමට අනුව අදාළ යෝජනා මාර්තු 15 වැනිදාට පෙර එවන ලෙස ඉල්ලා ඇත.

ජනමාධ්‍යයට අහිතකර නීතිවලින් සමන්විතව රාජ්‍යයට අවශ්‍ය ලෙස නිර්මිත පුවත්පත් මණ්ඩලය අහෝසි කළ යුතු බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ දිගුකාලීන ස්ථාවරය වන අතර ඒ පිළිබඳ විකල්ප යෝජනාද වරින්වර ඉදිරිපත් කර තිබේ. මාධ්‍ය සමාජයේ එකඟතාව මත ගොඩනැගෙන නියාමන ක්‍රමවේදයක් මිස රාජ්‍යය විසින් ඇති කරන නියාමන ක්‍රමවේදයකට අනෙකුත් බොහෝ මාධ්‍ය සංවිධානද එකඟ නැත. එසේ තිබියදී පුවත්පත් මණ්ඩලයේ විෂයපථය තවදුරටත් පුළුල් කොට එය ශක්තිමත් කිරීමට ගන්නා රජයේ උත්සාහය වෙනුවට විකල්ප යෝජනාවලියක්ද සැකසෙමින් පවතී.

3. **ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මකභාවයට පත් වී වසර 4ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කළ නිවේදනයේ අවධාරණය.**

තොරතුරු දැනගැනීමේ අයිතිය ශ්‍රී ලංකාව තුළ බලාත්මක වී පෙබරවාරි 03 වැනිදාට වසර 4ක් පිරීම නිමිති කරගෙන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව මඟින් ජනවාරි-පෙබරවාරි කාලය තුළ වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබිණි. එම වැඩසටහන් පිළිබඳවත්, කොමිසමේ ඉදිරි පියවර පිළිබඳවත් අදාළ නිවේදනයෙහි සඳහන් වේ.

පනත යටතේ තොරතුරු ලබා දීමේදී පොදු අධිකාරීන්ගෙන් සිදු වන ප්‍රමාදය ගැන දැඩිව අවධානය යොමු කරන බවද, පනත යටතේ වන සිය නිල රාජකාරිය මඟහැරීම සහ හිතාමාතාම ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු යැයි නිශ්චය කරන නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමින් කොමිෂන් සභාව විසින් නොතීසි යවනු ලබන බවද, පනත මගින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ව්‍යවස්ථාපිත බලය ප්‍රකාරව එබඳු පාර්ශ්වයන්ට එරෙහිව අපරාධ නඩු මගින් කටයුතු කිරීමට කොමිෂන් සභාව පසුබට නොවන බවද එම නිවේදනය අවධාරණය කරයි.

4. **ලංකාව තුළ තහනම් සංවිධානයක් වන එල්ටීටීඊ සංවිධානයේ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඡායාරූප ඇතුළත් වීඩියෝවක් 'ටික්ටොක්' සමාජ මාධ්‍ය තුළ පළ කළේය යන චෝදනාව මත විසිපස් හැවිරිදි තරුණයෙකු අත්අඩංගුවට ගැනීම.**

22 වැනිදා ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය (TID) මගින් වත්තල ප්‍රදේශයේදී මෙම තරුණයා අත්අඩංගුවට ගෙන තිබේ. පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මාධ්‍යයට ප්‍රකාශ කළ තොරතුරුවලට අනුව මුලතිව් ප්‍රදේශයේ උපත ලබා ඇති මෙම තරුණයා හැටන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඔහුගේ වීඩියෝව එල්ටීටීඊ සංවිධානය ප්‍රවර්ධනය කරන්නක් බවත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිකරණයෙන් රැඳවුම් නියෝගයක් ලබාගෙන වැඩිදුර විමර්ශන සිදු කරන බවත් හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

සමාජමාධ්‍යවල සිදු කරන විවිධ පළකිරීම් හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වරින්වර පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම් පිළිබඳව වාර්තා වී තිබේ. එහෙත් පවතින වාතාවරණය තුළ එම සිදුවීම් පිළිබඳව ස්වාධීන මූලාශ්‍රවලින් තොරතුරු සෙවීම දුෂ්කර වී ඇත.

https://bit.ly/3bWDcfF

## පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්:

**2008 වසරේදී ජාතික රූපවාහිනිය මගින් විකාශනය කළ සංවාදමය වැඩසටහනක් වාරණයට ලක් කිරීමට එරෙහිව ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ජයග්‍රහණය කිරීම.**

2008 නොවැම්බර් 04 වැනිදා ජාතික රූපවාහිනියේ විකාශනය වෙමින් තිබූ 'ඉරා අඳුරු පට' සජීවී සංවාද වැඩසටහන හදිසියේ වාරණයට ලක් කිරීමට එරෙහිව වසර 12ක් තිස්සේ විභාග වෙමින් පැවති මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් (අංක 556/2018 හා 557/2018) සම්බන්ධ නඩු තීන්දුව පෙබරවාරි 17 වැනිදා ප්‍රකාශයට පත් කෙරිණි.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ එවකට හිටපු කැඳවුම්කරු උවිඳු කුරුකුලසූරිය සහ රාවය පුවත්පතේ හිටපු විශේෂාංග කර්තෘවරයා හා නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ සාමාජිකයකු වූ ජයසිරි ජයසේකර විසින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කර තිබිණි.

එම සංවාද මණ්ඩපයට ආරාධිතයකු ලෙස සහභාගී වූ උවිඳු කුරුකුලසූරිය, අදාළ වාරණය නිසා තම අදහස් පළ කිරීමේ අයිතිය උල්ලංඝනය වූ බවටත්, ජයසිරි ජයසේකර, රූපවාහිනී ප්‍රේක්ෂකයකු ලෙස තම තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය වූ බවටත් අදාළ පෙත්සම් මගින් කරුණු දක්වා තිබිණි. ජනාධිපති නීතිඥ ජේ.සී. වැලිඅමුණ පෙත්සම්කරුවන්ගේ නීතිඥවරයා ලෙස ක්‍රියා කළේය.

අදාළ වාරණය හේතුවෙන් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට තීරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය, පෙත්සම්කරුවන්ට රු. 30,000 බැගින් වන්දි ගෙවන ලෙස රූපවාහිනී සංස්ථාවටත්, රු. 50,000 බැගින් ගෙවන ලෙස එවකට රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයාව සිටි මහාචාර්ය ආරියරත්න ඇතුගලටත් නියම කර තිබේ.

අදහස් පළ කිරීමේ අයිතිය, රජය හා ජනාධිපතිවරයා විවේචනය කිරීමේ අයිතිය, අධිකරණ අපහාසය, ප්‍රේක්ෂකයාගේ අයිතිය හා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වැදගත් උපුටනයන් රැසක් මෙම නඩු තීන්දුවට ඇතුළත් වේ. විශේෂයෙන්, ආණ්ඩුව පිළිබඳව විවේචනාත්මක අදහස් පළ කිරීම වාරණයට හේතුවක් නොවිය යුතු බව එමගින් අවධාරණය කරන අතර, රූපවාහිනී පනතෙහි වැඩසටහන්වල ප්‍රමිතිය සම්බන්ධයෙන් සඳහන් වන වගන්ති කෙරෙහිද අවධානය යොමු කර ඇත. ප්‍රේක්ෂකයාගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය මෙම තීන්දුව මගින් දෙවැනි වරටත් තහවුරු කර ඇත.

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙළ කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

**Free Media Movement**

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25